ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

ඉඩම් මහලේකම් කාර්යාලය,
නොමේ: 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
முகவரி: 1200/6, ராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
No: 1200/6, Rajamalwatta Road, Battaramulla.

ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2864051
ඊමේල් / மின்னஞ்சல் / E-mail: info@landcommdept.gov.lk

මගේ අංකය / எனது இல / MY NO: 5/1/ඡාප්ර/පොදු/ප්‍රතිපත්ති තීරණ

ඔබේ අංකය / உமது இல / YOUR NO:

දිනය / திகதி / DATE: 2014.10.24

05 NOV 2014

වක්‍රලේඛ අංක - 2014/06

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් සහ
නියෝජ්‍ය / සහකාර ඉඩම් කොමසාරිස් (අත්තර් පළාත්) වරුන් වෙත,

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍රයක් මත ලබා දී ඇති ඉඩමක් එම පනතේ විධිවිධානවලට පටහැනිව සකස් කරන ලද ලේඛන මත බැහැර කිරීම

ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය ප්‍රකාරව නිකුත් කර ඇති දීමනාපත්‍රවල අඩංගු කොන්දේසි එකී දීමනාපත්‍ර නිකුත් කළ දින පටන් සෑම විටම ඉඩමට සම්බන්ධව තිබිය යුතුවේ. ඒ අනුව එවැනි ඉඩමක මුල් අයිතිකරුවන්, සියළුම අනෙක් අයිතිකරුවන්ගෙන්, ඊට යම් අයිතිවාසිකමක් ලබන සියළුදෙනාගෙන් එකී කොන්දේසිවලින් බැඳී සිටිති.

දීමනාපත්‍ර ඉඩමක් අයිතිකරුවකු විසින් පනතේ විධිවිධාන වලට අනුකූලව බැහැර කිරීම් සිදු කළ හැක. පනතේ විධිවිධානවලට පටහැනි ලෙස බැහැරකිරීමක් සිදුකළහොත් එවැනි පැවරීම් ශූන්‍ය හා අවලංගු වන්නේය. එලෙස පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් දීමනාපත්‍ර ඉඩමක් පැවරීම සඳහා ලියා අත්සන් කරනු ලබන ලියවිල්ලක් ශූන්‍ය හා බල රහිතවේ.

නීතිමය තත්ත්වය මෙසේ වුවද මේවැනි නීති විරෝධී ලෙස දීමනාපත්‍ර ඉඩම් පැවරීම් සිදු කර ලියාපදිංචිකළ අවස්ථාවන් රාශියක් මෑත කාලය තුළ වාර්තා වී තිබේ. මේලෙසට නීත්‍යානුකූල නොවන ආකාරයට දීමනාපත්‍ර ඉඩම් පැවරීම් සිදුවීමත් මේවා ලියාපදිංචි වීම නිසා තවදුරටත් පැවරීම් දිගින් දිගටම සිදුවීමට ඉඩකඩක් පැවතීමත් නිසා විවිධ ගැටළු මතු වී තිබේ. මෙම ගැටළුවට පිළියමක් වශයෙන් එවැනි නීත්‍යානුකූල නොවනසේ ලේඛන සකස් කර දීමනාපත්‍ර පැවරීම් සිදුකර ඇති ලේඛන බල රහිත බවට ප්‍රකාශ කරමින් ලේඛනයක් ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සැලසීම සඳහා ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා විසින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ 2012.12.07 දින අංක 1787/36 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රයේ පලකරමින් 2012 ඉඩම් සංවර්ධන රෙගුලාසි පනවා ඇත.

එම රෙගුලාසිය ප්‍රකාරව ඉහතකී ලෙස ඉඩම් සංවර්ධන ආඥා පනතට පටහැනිව පැවරීම් ඔප්පු වැනි ලේඛන සකසා ලියාපදිංචි කර ඇති බව මා විසින් සැහීමකට පත්වුවහොත් මෙහි ඇමුණුම් 'අ' හි දැක්වෙන ආකෘතිය ප්‍රකාරව ප්‍රකාශිත ලේඛනයක් මා විසින් අත්සන් කර අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යවා ඉහත කී අකාරයේ නීත්‍යානුකූල නොවන ලේඛනයක් බල රහිත බවට ලියාපදිංචි කිරීමක් සිදු කරනු ලැබේ.

මෙවැනි දීමනාපත්‍ර මත බැහැර කරන ලද ඉඩමක් නීතිවිරෝධී ලෙස පවරා ඇති අවස්ථා අනාවරණය වී ඇති විට මෙම රෙගුලාසිය ප්‍රකාරව ක්‍රියාකිරීම සඳහා නොපමාව මා වෙත විස්තර සහිතව වාර්තා කළ යුතුයි. එවැනි අවස්ථාවකදී මා විසින් ඒ පිළිබඳව සුදුසු පරීක්ෂණයක් සිදුකරවා ඒ පිළිබඳව තහවුරුකර ගැනීමෙන් පසුව මෙම රෙගුලාසියට අදාළව මෙහි ඇමුණුම් 1 හි දක්වා ඇති ආකෘතිය මගින් ප්‍රකාශිත ලේඛනයක් ලියාපදිංචි කරවීමට පියවර ගනු ලැබේ.

මෙහි සඳහන් කරන ලද පනතට පටහැනිව කරන ලද දීමනාපත්‍ර පැවරීම් සඳහා යම් ප්‍රාදේශීය ලේකම්වරයකු අනුමැතිය ලබාදී තිබුණත් වුවද මෙම වක්‍රලේඛයේ විධිවිධාන අදාළ වන බව සැලකිය යුතුය. මෙම වක්‍රලේඛයේ විධිවිධාන මෙයට අදාළ රෙගුලාසිය පනවන ලද 2012.12.07 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වන බවද කාරුණිකව සලකන්න.

ආර්. පී. ආර්. රාජපක්ෂ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් -
1. ජනාධිපති ලේකම් - කා.දැ.පි.
2. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - කා.දැ.පි.
3. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශීය කටයුතු අමාත්‍යාංශය - කා.දැ.පි.
4. රෙජිස්ට්‍රාර් ජනරාල් - සියළුම දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර්වරු දැනුවත් කිරීමට
5. සියළුම දිස්ත්‍රික් ලේකම්වරු - කා.දැ.පි.
6. සියළුම පළාත් ඉඩම් කොමසාරිස් - අ.ක.ස.